# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2373/36 - 2024 පෙබරවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී. වී. 101137 දරන උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගනු ලබන, එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 සැප්තැම්බර් මස 07 දින අංක 2348/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "ව්‍යාපාර පරිපාලනපති" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී, අවම වශයෙන් අධ්‍යයන සම්භාර 15 කින් සමන්විත පර්යේෂණ සංරචකයක් සමග අධ්‍යයන සම්භාර 60 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (එස්එල්කිවුඑෆ් 10 වන මට්ටම) ඉලෙක්ට්‍රොනික සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන්, -

   (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් එස්එල්කිවුඑෆ් මට්ටම 6 හෝ ඊට වැඩි ඕනෑම ඉංජිනේරු උපාධියක්; හෝ

   (ආ) අධ්‍යයන මාර්ගයක් සහ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් මගින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයක ඕනෑම මට්ටමක සාමාජිකත්වයක්.

1A - PG 6659— 284 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ඉලෙක්ට්‍රොනික සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති | එම්එස්සී (ඉලෙක්ට්‍රොනික සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යා) |

ආචාර්ය ඒ. **ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2024 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.